www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

සෝනියා ගාන්ධි ඉන්දියාවේ අගමැති තනතුර ප්‍රතික්ෂේප කරයි

# මහ ව්‍යාපාරිකයන් හා හින්දු දක්ෂිනාංශය ඉදිරියේ නිවට නියාලු යටත් වීමක්

**Sonia Gandhi declines India's prime ministership**
**A craven capitulation to big business and the Hindu right**

**කීත් ජෝන්ස් විසිනි**
**2004 මැයි 20**

ඉන්දියානු හා ජාත්‍යන්තර මාධ්‍ය සමස්තය ම පාහේ ඉන්දියාවේ අගමැති තනතුර ප්‍රතික්ෂේප කිරීමට සෝනියා ගාන්ධි ගත් තීන්දුව ධෛර්ය සම්පන්න ස්වයං කැප කිරීමක් ලෙස දැඩි ප්‍රශංසාවට ලක් කර ඇත. යථා වසයෙන් ගත් කල එය වනාහි නිවට නියාලු යටත් වීමකි. හින්දු අධිපතිවාදී දක්ෂිනාංශයට යටත් වීමකි -- භාරතීය ජනතා පක්ෂය (බීජේපී) "විදේශීය" අගමැතිවරියක නිසා ඇති වන "ලජ්ජාවට" එරෙහිව උද්ඝෝෂනයක් අරඹා තිබුනි. එහෙත් වඩාත් අතිමූලිකව ගත් කල එය වනාහි ඉන්දියානු හා ජාත්‍යන්තර ප්‍රාග්ධනය ඉදිරියේ කල යටත් වීමකි.

දුසිම් භාගයක් පමන වන ප්‍රාදේශීය පක්ෂවල හා වාම පෙරමුනේ සහයෝගයෙන් ඉන්දියාවේ නව ආන්ඩුව තැනීමට යන ගාන්ධිගේ කොංග්‍රස් පක්ෂය දැන් අගමැති තනතුර වෙනුවෙන් මන්මෝහන් සිං නම් කර ඇත. නරසිම්හ රාඕගේ කොංග්‍රස් ආන්ඩුවේ මුදල් ඇමති ලෙස කටයුතු කල සිං 1991 පටන් ඉන්දියාවේ සියලු ම ආන්ඩු අනුගමනය කල ආර්ථික "ලිබරලීකරන" න්‍යාය පත්‍රයේ මූලික නිර්මාතෘවරයා විය. මහ ව්‍යාපාරිකයන් දිගු කලක් තිස්සේ ඔහුට සලකන්නේ කොංග්‍රස් නායකත්වය තුල සිටිනා තමන්ගේ ප්‍රමුඛතම නියෝජිතයා ලෙස ය.

පසු ගිය සතියේ මහ මැතිවරන ප්‍රතිඵලවලින් ඇති වූ කම්පනයට ප්‍රතිචාර දක්වමින් ඉන්දියාවේ කොටස් වෙලඳ පොලවල් කඩා වැටුනි. ලෝක ධනවාදය සඳහා ලාභ ශ්‍රම පරාදීසයක් බවට ඉන්දියාව පත් කිරීමේ ප්‍රයත්නයේ ප්‍රතිඵලයක් ලෙස වැඩෙන දරිද්‍රතාවට, ආර්ථික අනාරක්ෂිත භාවයට සහ සමාජ ධ්‍රැවාන්තගත වීමට එරෙහි මහජන ප්‍රතිප්‍රහාරයක් මගින් මැතිවරනයේ දී බීජේපී නායකත්වයෙන් යුත් ජාතික ප්‍රජාතන්ත්‍ර සන්ධානය බලයෙන් පහ විය. කෙසේ වෙතත් ගාන්ධි අගමැති තනතුර මුලුමනින් ම ප්‍රතික්ෂේප කල බවත් ඇය වෙනුවට සිං නම් කිරීමට ඉඩ ඇති බවත් අඟහරුවාදා සවස් වරුවේ දැන ගන්ට ලැබීමත් සමග ම කොටස් අගයන් ඉහල නැගීමට පටන් ගති. ඉන්දියාවේ විශාලතම කොටස් වෙලඳ පොල වන බොම්බායේ කොටස් වෙලඳ පොල සියයට 8කින් නැංගේ ය. එය එතෙක් එක් දිනක් තුල සිදු වූ දෙවන විශාලතම නැගීම යි.

ඉන්දියානු ව්‍යාපාරිකයන්ගේ ප්‍රකාශකයෝ සිං සහ ගාන්ධිගේ "රාජ්‍ය තාන්ත්‍රික භාවය" පිලිබඳව ප්‍රශංසා වැසි වස්සවමින් සිටිති. "අගමැති තනතුර භාර නොගැනීම ද සමබරතාව, ආර්ථික ඥානය, නිහතමානී භාවය සහ මිනිසුන්ට සවන් දීමේ හැකියාව සම්බන්ධයෙන් ප්‍රසිද්ධ සිංගේ නම නිර්දේශ කිරීම ද මගින් සෝනියා ගාන්ධිගේ කීර්තිය දැවැන්ත ලෙස ඉහල නැග තිබේ" යැයි ඉන්දියානු කර්මාන්ත සම්මේලයේ අධ්‍යක්ෂ ජනරාල් එන්. සිරිනිවාසන් ඉන්දියාවේ විශාලතම ප්‍රවෘත්ති ඒජන්සියට පැවසී ය.

මහ ව්‍යාපාරිකයන් ගාන්ධි සිං ඔසවා ලීම දකින්නේ බලයට එන ආන්ඩුව සිය ඡන්ද දායකයන්ගේ ප්‍රතිරෝධය නො තකා තම ලිබරලීකරන න්‍යාය පත්‍රය ඉදිරියට ගෙන යනු ඇති බවට කල සුභදායක සංඥාවක් ලෙස ය.

ගාන්ධි තම තීන්දුව සම්බන්ධයෙන් ප්‍රසිද්ධියේ පැහැදිලි කිරීමක් කොට නැත. ඇය කොංග්‍රස් නායකයන් ඉදිරියේ කල ප්‍රකාශයක් ප්‍රවෘත්ති මාධ්‍ය වෙත ද ලිඛිතව ඉදිරිපත් වී ඇත. ඒ අනුව ඇය කියා සිටියේ අගමැති වීමේ අවශ්‍යතාවක් තමාට කිසි දාක නො තිබුනු බව යි. මෙම කියා පෑම ඇගේ කොංග්‍රස් පක්ෂයේ සියලු ම මට්ටම්වලින් පල වූ ප්‍රතිචාරයන් මගින් නිෂ්ප්‍රභ වේ. කොංග්‍රස් පාර්ලිමේන්තු කන්ඩායම ඒකමතිකව ගාන්ධිගෙන් ඉල්ලා සිටියේ ඇගේ තීන්දුව අවලංගු කරන ලෙස යි. කොංග්‍රස් කෘත්‍යාධිකාරී කමිටුවේ සමහර සාමාජිකයෝ විරෝධය පෑමක් ලෙස සිය තනතුරුවලින් ඉල්ලා අස් වන බවට ද තර්ජනය කොට තිබේ. ඒ අතරතුර කැලඹීමට පත් කොංග්‍රස් කාඩර්වරු ගාන්ධිගේ දිල්ලි නිවස සහ බීජේපී මූලස්ථානය අභියස විරෝධතා දැක්වීමෙහි ද නිරත වූහ.

1998 පටන් කොංග්‍රසයේ නිල නායිකාව වන හා ඉතා මෑත දී හමාර වූ මැතිවරන ව්‍යාපාරයේ දී පක්ෂයේ ප්‍රධාන ප්‍රකාශක ලෙස ක්‍රියා කොට ඇති ගාන්ධි අගමැති තනතුර භාර ගැනීමට තමන් සූදානම් බව සෑම

අයුරකින් ම අඟවා තිබුනි. පසු ගිය සති අන්තයේ දී ඇය කොංග්‍රස් පාර්ලිමේන්තු කන්ඩායමේ ප්‍රධානයා ලෙස යලි තේරී පත් වූ අතර කොංග්‍රසයේ නායකත්වයෙන් යුත් සභාග ආන්ඩුවක් බලයට ගෙන ඒමට අවශ්‍ය ඡන්ද සපයනු ඇති පක්ෂවල නායකයන් හමු වීමේ හෝ ඔවුන් සමග සාකච්ඡා කරනු පිනිස සිය නියෝජිතයන් මෙහෙයවීමේ නිමග්නව සිටියා ය.

ස්වකීය අභිමතය පරිදි ගත් මතභේදාත්මක දේශපාලන තීන්දු යුක්ති යුක්ත කරනු වස් මහත්මා ගාන්ධි යොදා ගත් උපායක් අනුකරනය කරමින් සෝනියා ගාන්ධි කොංග්‍රස් නායකත්වයට පැවසුවේ තමන් ස්වකීය "අභ්‍යන්තරයෙන් ම ගලා එන හඬට" ප්‍රතිචාර දක්වන බව යි. තමන්ට බලය හැසිරවීමේ කිසිදු අවශ්‍යතාවක් නැති බව ද ඇය කියා පෑවා ය. එහෙත් අගමැති තනතුර ප්‍රතික්ෂේප කිරීමේ දී ඇය කොංග්‍රස් දේශපාලන යන්ත්‍රය මත පවත්නා ඇගේ හෝ නේරු-ගාන්ධි පවුලේ පාලනය ලිහිල් කිරීමට නම් කිසි සේත් ම පියවර ගෙන නැත. අඟහරුවාදා පක්ෂයේ ව්‍යවස්ථාව සංශෝධනය කරමින් කොංග්‍රස් සභාපති නමින් නව තනතුරක් නිර්මානය කෙරුනි. එම තනතුරේ ප්‍රධාන පරමාධිකාරය වන්නේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රී මන්ඩල දෙකෙහි කොංග්‍රස් පක්ෂ කන්ඩායම්වල නායකයන් තේරීම යි, එනයින් කොංග්‍රසය ආන්ඩුව තැනීමට සමත් වන විට අගමැති තේරීම යි. (මේ වන තෙක් ම එම නායකයන් තෝරා පත් කලේ කොංග්‍රස් පාර්ලිමේන්තු සභිකයන් ය.) සෝනියා ගාන්ධි කොංග්‍රස් සභාපතිනිය ලෙස වහා ම නම් කෙරුනු අතර එයින් අදහස් වන්නේ අනතුරුව අගමැති තනතුර සඳහා ඇගේ තේරීම ලෙස නම් කෙරුනු මන්මෝහන් සිං ඇගේ කැමැත්ත පරිදි ක්‍රියා කරනු ඇති බව යි.

මේ අතරතුර ගාන්ධිගේ පුද්ගලික සහායකයන් හා කොංග්‍රස් නායකයන් ප්‍රසිද්ධ කොට ඇත්තේ හින්දු අධිපතිවාදීන් ඇය අගමැති තනතුරට පත් වීමට බලගතු ලෙස විරුද්ධ වූ තතු යටතේ ඇගේ පවුල ඇයගේ ආරක්ෂාව සම්බන්ධයෙන් බිය වී ඇති බව සහ තමන් ඉන්දියානුවකු නොවන බවට බීජේපීය හා රාෂ්ට්‍රීය ස්වයංසේවක් සංග් (ආර්එස්එස්) සිදු කර ඇති ප්‍රකාශ හේතු කොට ගෙන ඇය පුද්ගලිකව සිත් වේදනාවට පත්ව ඇති බව සහ රට බෙදීමට ලක් වනු දැකීමට ඇය අකැමති බව යි.

කෙසේ වෙතත් බීජේපීය හා ආර්එස්එස් සම්බන්ධයෙන් ගත් කල ගාන්ධිගේ ඉතාලි ජන්මය පිලිබඳ කරුන වනාහි ජාතිවාදී වෛරය ඇවිලවීම ද මැතිවරන ප්‍රතිඵල අවලංගු කිරීමේ ප්‍රයත්නයක් ද වෙනුවෙන් යොදා ගන්නා හුදු ව්‍යාජ හේතුවක් වී ය යන්න සෑම කෙනෙකු ම දන්නා කාරනාවකි. ගාන්ධි අගමැති තනතුර ප්‍රතික්ෂේප කිරීම හින්දු අධිපතිවාදීන්ගේ ජාතිය "භේද කිරීමේ" ප්‍රයත්නය නතර නො කරනු ඇත. ඒ වෙනුවට හින්දු අධිපතිවාදීන්ගේ පීඩනයට හිස නැමීම මගින් ඉන්දියාවේ ඡන්ද දායකයන් ප්‍රතික්ෂේප කල යුක්ති යුක්ත භාවයක් ගාන්ධි ඔවුන්ට ප්‍රදානය කර තිබේ.

ගාන්ධිගේ ක්‍රියාව අනුමත කල ප්‍රවෘත්ති මාධ්‍යවල ඝෝෂාව මධ්‍යයේ ම හින්දු දක්ෂිනාංශයේ දාමරිකත්වයට හා යන්තම් ආවරනය වූ ප්‍රචන්ඩ තර්ජනයට එලෙස යටත් වීමක් මගින් ඇති වන බලපෑම පිලිබඳ උත්සුකතා ද ප්‍රකාශයට පත් වී තිබේ. "*සංඝ පරිවාර්* (ආර්එස්එස් මෙහෙයවන සංවිධාන ජාලය) තුල සිටින ඇගේ වඩාත් ම ඝෝෂාකාරී විවේචකයන් සමහර දෙනකු ප්‍රීති ඝෝෂා පැවැත්වීමට පොලඹවන සාධකයක් දැන් නිර්මානය වනු ඇත." යි *හින්දුස්ථාන් ටයිම්ස්* පුවත්පත ප්‍රකාශ කලේ ය. "ගාන්ධි මහත්මිය ඇගේ අභිප්‍රාය ආරම්භයේ දී ම පැහැදිලි කලේ නම් ඇගේ උතුම්, නිර්භීත සහ පරාර්ථකාමී තීන්දුව මීට වඩා බලපෑමක් ඇති කිරීමට ඉඩ තිබුනි."

ගාන්ධිගේ "විස්මයජනක ස්වයං ප්‍රතික්ෂේපන ක්‍රියාව" - සුෂ්මා ස්වරාජ්ලා, උමා භාරතීලා, ගෝවින්දචාර්යලා (මොවුහු සියල්ලෝ ම බීජේපීයේ ප්‍රබලයෝ ය) සහ සෙසු *සංඝ පරිවාර්* කොටස් මැතිවරනයේ ජන වරම අවහිර කිරීමට හා එය පෙරලා දැමීමට දියත් කර ඇති දුෂ්ට ව්‍යාපාරය අනුමත කිරීමක් ලෙස දැකීමට ඉඩ දිය" යුතු නැති බවට *හින්දු* පත්‍රය, තම පාර්ශ්වයෙන් සලකා අයැද සිටියේ ය. "කවර ප්‍රජාතන්ත්‍ර ක්‍රමයක දී වත් ජය ගත්තේ හා පරාජයට පත් වූයේ කවුරුන් ද යන්න පිලිබඳ විනිසුරුගේ තීන්දුවට ඉහලින් ක්‍රියා කිරීමේ බලයක් මැතිවරනයකින් පරාජයට පත් වූවන්ට ලැබෙන්නේ නැත."

වැඩ කරන ජනතාව කොංග්‍රසයට සහාය දිය යුතු බවටත් එමගින් බීජේපීය යලි බලයට පත් වීම වැලැක්විය යුතු බවටත් මැතිවරන ව්‍යාපාරය මුලුල්ලේ ම තර්ක කල වාම පෙරමුනේ නායකයෝ ගාන්ධිගේ තීන්දුව පිලිගැනීමේත් ඉන්දියානු අගමැති තනතුර සඳහා මහ ව්‍යාපාරිකයන්ගේ තේරීමට සහයෝගය දීමේත් සිය සූදානම වහා ම ප්‍රකාශයට පත් කලහ.

කෙසේ වෙතත් අනතුරුව ගාන්ධි මන්මෝහන් සිං ඉස්මත්තට ගෙන ඒම පිලිබඳව ඔවුහු සිය කම්පනය හා උත්සුකතාව ඇඟවුම් කලහ. මෙය සත්‍ය නම් එයින් ඔප්පු වනුයේ ඔවුන්ගේ හිතුවක්කාරී වූත් සාපරාධී වූත් දේශපාලන දුර නොදක්නා ස්වභාවය යි. *ටයිම්ස් ඔෆ් ඉන්දියා* පත්‍රයට අනුව, "ගාන්ධි මහත්මිය සමග අතිශයින් ම සුහද සබඳතාවක් පවත්වා ගෙන යන" ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂයේ (මාක්ස්වාදී) -- සීපීඅයි (එම්) -- ප්‍රධාන ලේකම් එච්.එස්. සුර්ජීට්ට සහ බටහිර බෙංගාලයේ හිටපු සීපීඅයි (එම්) මහ ඇමති ජෝති බාසුට, "ඇගේ තීන්දුව මුලුමනින් ම විශ්වාස කල නොහැකි විය." සීපීඅයි (එම්) බෙංගාලි භාෂාවෙන් පල කරන දිනපතා පත්‍රය ගාන්ධිගේ තීන්දුව නම් කලේ, "වර්ගවාදී බලවේග තව දුරටත් ශක්තිමත් කරන" යටත් වීමක් ලෙස ය.

ඉන්දියානු ප්‍රභූ පැලැන්තියේ සාම්ප්‍රදායික පාලක පක්ෂය වන කොංග්‍රසය ජනතාවාදී හා ව්‍යාජ සමාජවාදී පවා වන පූර්වාවානමකට මුවා වෙමින් ප්‍රතිගාමීත්වයේ වර්ධනයට මාවත සකසා ඇති පිලිවෙත් ඉදිරියට ගෙන

ගොස් තිබේ. පලමුව එය ගෙන ගියේ ජාතික ධනේශ්වරයේ ක්‍රියා කලාපය ශක්තිමත් කිරීමට සේවය කල එහෙත් ඉන්දියාවේ වැඩ කරන ජනතාව දරිද්‍රතාවේ ම ගිල්වා තැබූ ජාතික සංවර්ධන ව්‍යාපෘතියකි. පසුව 1990 ගනන් මුල දී කොංග්‍රසය මුලුමනින් ම වෙනස් මගක් ගනිමින්, පුද්ගලීකරනය, රෙගුලාසිහරනය සහ රාජ්‍ය හා සමාජ සේවාවන් ද සුලු ගොවීන්ට දුන් සහන ද දැවැන්ත ලෙස කප්පාදු කිරීම හරහා ඉන්දියාව විදේශ ප්‍රාග්ධනය ආකර්ෂනය කර ගන්නා මධ්‍යස්ථානයක් බවට පත් කිරීම ඉලක්ක කර ගත්, අපනයන මගින් දිවෙන වර්ධනයක් පිලිබඳ මූලෝපාය වැලඳ ගති.

එපමනක් නො ව හින්දු දක්ෂිනාංශයට අනුගත වීමේත් එය සමග සහයෝගීව කටයුතු කිරීමේත් දීර්ඝ හා තුච්ඡ ඉතිහාසයක් කොංග්‍රසයට පවතී. 1947 වසන්තයේ දී කොංග්‍රස් නායකත්වය උපමහාද්වීපය ජනවාර්ගික පදනමින් බෙදීම පිලිබඳව බ්‍රිතාන්‍යයන් හා මුස්ලිම් ලීගය සමග සාකච්ඡා කරමින් සිටින විට පවා, එය ශ්‍යාමා ප්‍රසාද් මුකර්ජීගේ නායකත්වය යටතේ හින්දු ආධිපත්‍යය සහිත බටහිර බෙංගාලයක් නිර්මානය කිරීම සඳහා උද්ඝෝෂනය කලේ ය. මුකර්ජී යනු බීජේපීයේ ඍජු සංවිධානමය හා දෘෂ්ටිමය පෙරගමන්කරු වූ ජන සං සංවිධානය පිහිටුවීම පිනිස කටයුතු කල හින්දු මහාසභා නායකයා ය. ඉන්දියානු ස්වාධීනත්වයේ මුල් කාලයේ දී අභ්‍යන්තර කටයුතු ඇමතිවරයා හා කොංග්‍රස් නායකත්වය සඳහා ජවහර්ලාල් නේරුගේ ප්‍රධාන ප්‍රතිවාදියා වූ වලාභායි පටෙල් කොංග්‍රසයට ආර්එස්එස් ඇතුලු කර ගැනීම පිලිබඳව සාකච්ඡා කිරීමට යලියලිත් උත්සාහ කලේ ය. අයෝධ්‍යාහි බබ්රි මස්ර්ඩ් පල්ලිය බිමට සමතලා කර දැමීමෙන් ද උපමහාද්වීපය බෙදීමෙන් පසුව මේ දක්වා පැවති දරුනු ම ජනවාර්ගික කලකෝලාහලවලින් ද කෙලවර වූ බීජේපී උද්ඝෝෂනයට මුහුන දීමට ඇති අපොහොසත් භාවයත් නොහැකියාවත් ඔප්පු කල 1990 ගනන් මුල පැවති කොංග්‍රස් ආන්ඩුවේ ජ්‍යෝෂ්ඨ ඇමතිවරයකු ලෙස මන්මෝහන් සිං සේවය කලේ ය.

එහෙත් ගාන්ධිගේ තීන්දුව හින්දු අධිපතිවාදී දක්ෂිනාංශයට අනුගත වීමක් වූයේ නම්, එය ඊටත් වඩා, ඉන්දියාවේ වැඩ කරන ජනයාට කුමක් අවශ්‍ය වුවත් එය නො තකා බලයට එන ආන්ඩුව මහ ව්‍යාපාරිකයන්ගේ න්‍යාය පත්‍රය ඉදිරියට ගෙන යනු ඇත යන කාරනාව ඉන්දියානු හා විදේශ ප්‍රාග්ධනය ඉදිරියේ ප්‍රදර්ශනය කිරීමක් විය.

එනම් කොංග්‍රසය ආර්ථික ප්‍රතිසංස්කරනවලට විරුද්ධව උද්ඝෝෂනය කර තිබුනු බව නො වේ. එහෙත් ඡන්ද රැස් කර ගනු පිනිස එය මැතිවරන ව්‍යාපාරය තුල දී මිශ්‍ර වැඩ පිලිවෙලක් ඉදිරිපත් කලේ ය. එනම් විවිධාකාර ජනතාවාදී පොරොන්දු දීම මගින් රැකියා නැතිකම හා වැඩෙන ආර්ථික අමාරුකම් පිලිබඳ මහජන වෛරයට ආයාචනය කරන අතර ම ඉන්දියාවේ ජාතිකව-පාලිත ආර්ථිකය බිඳ විසිරවීම තව දුරටත් ඉදිරියට ගෙන යාම සඳහා සිය සහයෝගය දෙන බවට ව්‍යාපාරිකයන්ට පොරොන්දු විය.

මැතිවරන ප්‍රතිඵල මගින් කම්පනයට පත් වූ ඉන්දියානු හා විදේශ ව්‍යාපාරිකයෝ තමන් මොන යම් හෝ කල් ගැනීමක් පිලිගැනීමට සූදානම් නැති බව කොංග්‍රස් නායකත්වය වෙත අවධාරනය කිරීමෙහි ලා අධිෂ්ඨානශීලී වූහ. ප්‍රාග්ධනය, ඒ හැටියට ම ගත් කල, සෝනියා ගාන්ධි විවේචනය කිරීමට අවස්ථාවක් එලඹෙන තෙක් බලා සිටියේ ය. එහෙත් ඇය අගමැති තනතුර භාර ගැනීම ප්‍රතික්ෂේප කොට ඒ වෙනුවට මන්මෝහන් සිං නම් කල විට, ඇගේත් කොංග්‍රසයේත් අභිප්‍රාය වන්නේ ඉන්දියාවේ වැඩ කරන ජනයාගේ හඬට නො ව වෙලඳ පොලවලට ඇහුම්කන් දීම ය යන වග ඇය නාටකාකාර ලෙස නිරූපනය කර ඇතැයි ප්‍රාග්ධනය ඉක්මනින් ම පිලිගත්තේ ය.

*වෝල් ස්ට්‍රීට් ජර්නල්,* පුවත්පතේ බදාදා කලාපයෙහි ප්‍රධාන කතුවැකිය, එලඹෙන කොංග්‍රස් ආන්ඩුවට ඍජු පනිවිඩයක් යවනු පිනිස මෑත අවමිල කොටස් අලෙවිය යොදා ගැනීමෙහි ලා ජාත්‍යන්තර ප්‍රාග්ධනය ලත් සාර්ථකත්වය පිලිබඳ සිය සතුට ප්‍රසිද්ධියේ ප්‍රකාශයට පත් කලේ, ඒ වන විට තේරීම සහතික නො වී තිබූ මන්මෝහන් සිං "වඩාත් ම විශ්වාසය ඇති කරන අපේක්ෂකයා" බව ප්‍රකාශ කරමිනි. *ජර්නලය* තව දුරටත් මෙසේ පැවසී ය: "පසු ගිය සතියේ පාඩම වනාහි... ඉන්දියාවට ආර්ථික බලයක් වීමට ඇත්තට ම අවශ්‍ය නම් එරට සිටින ස්වකීය ඡන්ද දායකයන්ට අමතරව ආයෝජකයන් ලෙස ප්‍රසිද්ධ භූගෝලීය ඡන්ද දායකයන්ට ද ඇහුම්කන් දීමට එයට සිදු වන බව යි. ඉන්දියාව දැන් අවධානය මෙන් ම ප්‍රාග්ධනය ද ආකර්ෂනය කර ගනී. ආර්ථික පුනර්ජීවනයක් දිරි ගැන්වීම පිනිස සහාය වී ඇති වෙලඳ පොල බලවේග ම පිලිවෙත් සම්බන්ධ අත්වැරදිවලට ක්ෂමා විරහිතව දඬුවම් කරනු ඇත."

එක්සත් ජනපදය පසු ගිය දශකය මුලුල්ලේ, බොහෝ සෙයින් ඉන්දියාවේ විශාලතම වෙලඳ සහකරුවා බවට පත්ව තිබේ. ඉන්දියාව ප්‍රධාන ලාභ ශ්‍රම නිෂ්පාදන මධ්‍යස්ථානයක් -- විශේෂයෙන් ම තොරතුරු තාක්ෂන, ව්‍යාපාර සැකසුම් හා ඖෂධ හා ජෛව-තාක්ෂන පර්යේෂන අංශ තුල -- බවට පත් කිරීමෙහි ලා ඉන්දියානු ප්‍රාග්ධනයට පවත්නා අභිලාෂයන් වෝල් වීදිය ද බෙදාහදා ගනී. එමෙන් ම ඉන්දියානු මහ ව්‍යාපාරිකයන් සේ ම වෝල් වීදිය ද ඉන්දියාවේ ලිබරලීකරන-විරෝධී මැතිවරන ජනවරම ඉක්මනින් ම හා තීරනාත්මකව අවලංගු කර දමනු දැකීමට අධිෂ්ඨානශීලීව සිටී.

ජනතාවාදී වාග් පාඨවල පදනම මත තේරී පත්ව බලයට පත් වන ධනේශ්වර ආන්ඩුවක් මෙතරම් ඉක්මනින් ම සිය සැබෑ ස්වභාවය එලිදරව් කර ඇත්තේ කලාතුරකිනි. වාම පෙරමුනේ සහාය ලබන තවමත් පිහිටුවීමට නියමිත කොංග්‍රස් තන්ත්‍රය, හින්දු දක්ෂිනාංශය සමග සහයෝගී වන හා ඉන්දියානු මහ ව්‍යාපාරිකයන්ගේ හා ජාත්‍යන්තර ප්‍රාග්ධනයේ න්‍යාය පත්‍රය ක්‍රියාවට දමන ආන්තිකව අර්බුද-ග්‍රස්ත ආන්ඩුවක් වනු ඇත.

© www.wsws.org